## ප්‍රදීප් කමල් පෙරේරා එ. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 23 /2018 (2018.09.17 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි **(ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.**

සභාපති: මහින්ද ගම්මම්පිල
කොමිෂන් සභා සමාජික: ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
කොමිෂන් සභා සමාජික: ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
කොමිෂන් සභා සමාජික: විනිසුරු රෝහිණී වල්ගම

අධ්‍යක්ෂ ජනරාල් - පියතිස්ස රණසිංහ

අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
නොතිසි ලත් පාර්ශවය - ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පෙනීසිටීම
අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
පොදු අධිකාරිය - ඒ.බී.ඩබ්ලිව්. කුමාරසිංහ, අතිරේක ලේකම් (පරිපාලන)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2017.07.31 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2017.08.09, 2017.10.03 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017.09.10 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | **2017.10.30** |

අභියාචනයට පසුබිම් වූ කරුණු:

අභියාචක විසින් 2017.07.31 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

*නුවර එළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් මා වන ප්‍රදීප් කමල් පෙරේරා එවන ලද පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද?*

1. *මේ පිළිබඳව නිසි විමර්ශනයක් සිදුව තිබෙනවාද?*
2. *එවන ලද ලිපි හා ෆැක්ස්වලට සිදුව ඇත්තේ කුමක්ද?*
3. *අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් මේ විමර්ශනවලට බලපෑම් සිදුවනවාද?*
4. *අදාළ තාක්ෂණ නිලධාරීන්ට ස්ථාන මාරු ලබා දුන්නේ කාගේ අනුමැතියෙන්ද?*
5. *මේ විමර්ශන යට ගැසීමක් සිදුව තිබෙනවාද?*

2017.08.09 දිනැතිව තොරතුරු නිලධාරියා ප්‍රතිචාර දක්වා ඇත්තේ අයදුම්පත්‍රය ලැබුණු බවත් ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග දින 14ක් තුළ අභියාචක වෙත දන්වනු ලබන බවත්ය. නියමිත දින 14 ක කාලය ඉක්මවීමෙන් වුවද පිළිතුරක් නොලැබුණු හෙයින් අභියාචක 2017.09.10 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොළුම්කරන ලදි. 2017.10.03 දිනැතිව නැවත්ත නම්කළ නිලධාරියා අභියාචක වෙත දන්වන ලද්දේ අදාළ තොරතුරු අදාළ අංශවලින් ලබා ගැනීමට හා ලිපි ලේඛන පරීක්ෂා කර බලා පිළිතුරු සැපයීමට දින 14ක් තුළ අපහසු හෙයින් ඒ සඳහා දින 14ට අමතරව තවත් දින 21ක කාලයක් ගතවන බවයි. නමුත් තොරතුරු නිලධාරියා නියමිත කාල සීමාවට අනුව කටයුතු කිරීමට අපොහොසත්වීම හා නම්කළ නිලධාරියාගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබීමෙන් අතෘප්තියට පත් අභියාචක 2017.10.30 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරයි. අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු සම්බන්ධයෙන් පොදු අධිකාරිය විසින් ලබාදුන් පිළිතුරු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පහත පරිදි නිරීක්ෂණය කර සිටී.

1. විමර්ශන ක්‍රියාත්මක වෙමින් පවතී. නමුත් ඒ පිළිබඳව අභියාචකව දැනුවත් කර නැත. පොදු අධිකාරියේ නියෝජිතයාට අදාළ කරුණ ගැන එතරම්ම වැටහීමක් නොමැත.
2. අභියාචක විසින් යොමුකර ඇති සියලු ලිපි නිසි පරිදි ඇමිණිය යුතුය.
3. අදාළ විමර්ශනයන් සාධාරණව හා අපක්ෂපාතීව පැවැත්වීද යන්න අභියාචකට දැනගැනීමට අවශ්‍යය.
4. තාක්ෂණ නිලධාරීන්ගේ මාරුවීම සිදු වූ ආකාරය? පොදු අධිකාරිය විසින් එය සිදු වූ හා සිදුකළ ආකාරය පිළිබඳ පිළිතුරක් ලබා දිය යුතුමය.
5. එය අනවශ්‍ය ලෙස කල්දමා ඇති බව පැහැදිලිය.

නියෝගය:
පොදු අධිකාරිය විසින් අයිතම පහටම පිළිතුරු සැපයිය යුතුය. මීළඟ අභියාචනා විභාගයේදී දෙපාර්ශ්වයම සහභාගී විය යුතුය. අභියාචක විසින් පොදු අධිකාරියට යොමුකළ ලිපි නිසි පරිදි අමුණා සති දෙකක් තුළ පොදු අධිකාරියට හා කොමිෂන් සභාවට යොමුකළ යුතුය.
මීළඟ අභියාචනා විභාගය **2018.10.29** දිනට කල්තබන ලදි.

*****

**RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 23 /2018 (2018.10.29 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| සභාපති: | මහින්ද ගම්මම්පිල |
| කොමිෂන් සභා සමාජික: | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| කොමිෂන් සභා සමාජික: | ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| කොමිෂන් සභා සමාජික: | විනිසුරු රෝහිණී වල්ගම |

අධ්‍යක්ෂ ජනරාල් - පියතිස්ස රණසිංහ

අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
නොතිසි ලත් පාර්ශවය - ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පෙනීසිටීම
අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
පොදු අධිකාරිය - පැමිණ නැත

අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:

අභියාචනා විභාගය සඳහා අභියාචක පැමිණ ඇතත් පොදු අධිකාරිය පැමිණ නැති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

නියෝගය:
කොමිෂන් සභාව විසින් පළමු අභියාචනා විභාගයේදී අතුරු නියෝගයක් ලබා දී ඇත. අභියාචනා විභාගය අවසන් කරනු ලැබේ. අවසාන නියෝගය දෙපාර්ශ්වයටම සන්නිවේදනය කරනු ලැබේ. කෙසේවෙතත්, පොදු අධිකාරියට පමණක් 2019.01.07 වනදින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට නියෝග කර සිටී.

*****

**RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 23 /2018 (2019.01.07 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක **28** යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

සභාපති: මහින්ද ගම්මම්පිල
කොමිෂන් සභා සමාජික: ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
කොමිෂන් සභා සමාජික: ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
කොමිෂන් සභා සමාජික: විනිසුරු රෝහිණී වල්ගම

අධ්‍යක්ෂ ජනරාල් - පියතිස්ස රණසිංහ

අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
නොතිසි ලත් පාර්ශවය - ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පෙනීසිටීම
අභියාචක - පැමිණ නැත
පොදු අධිකාරිය - පැමිණ සිටී.

අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:

පොදු අධිකාරිය අභියාචනා විභාගය සඳහා පැමිණ සිටින බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

කොමිෂන් සභාවේ අතුරු නියෝගය ප්‍රකාරව අභියාචක විසින් අදාළ ලිපි නිසිලෙස ඇමිණූ ලේඛනයක් හෝ එම දින සඳහන් කළ ලිපියක් පොදු අධිකාරියට තවමත් යවා නොමැති බව පොදු අධිකාරියේ කරුණු දැක්වීම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

නියෝගය:

ඒ අනුව මීළඟ අභියාචනා විභාගය 2019.04.22 දිනට කල්තබන ලදි.
*****

**RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 23 /2018 (2019.04.22 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

සභාපති: මහින්ද ගම්මම්පිල
කොමිෂන් සභා සමාජික: ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
කොමිෂන් සභා සමාජික: ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
කොමිෂන් සභා සමාජික: විනිසුරු රෝහිණී වල්ගම

අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
නොතිසි ලත් පාර්ශවය - ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පෙනීසිටීම
අභියාචක - පැමිණ නැත
පොදු අධිකාරිය - පැමිණ නැත

අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:

පොදු අධිකාරිය 2019.04.22 දිනැතිව අභියාචක ෆැක්ස් පණිවිඩයක් යොමුකරමින් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ රටේ උද්ගතව ඇති තත්වය මත ඇඳිරි නීතිය හා අනෙකුත් සේවාවන්ගේ ඇති ප්‍රශ්න මත අද දින අභියාචනා විභාගයට සහභාගී විය නොහැකි බවත් අභියාචනා විභාගය සඳහා වෙනත් දිනයක් ලබා දෙන ලෙසත්ය.

මීළඟ අභියාචනා විභාගය 2019.06.11 දිනට කල්තබන ලදි.
*****

**RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 23 /2018 (2019.06.11 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

සභාපති: මහින්ද ගම්මම්පිල

| | |
|---|---|
| කොමිෂන් සභා සමාජික: | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| කොමිෂන් සභා සමාජික: | ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| කොමිෂන් සභා සමාජික: | විනිසුරු රෝහිණී වල්ගම |

අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
නොතිසි ලත් පාර්ශවය - ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පෙනීසිටීම
අභියාචක - ප්‍රදීප් කමල් පෙරේරා
පොදු අධිකාරිය - ඒ.බී.ඩබ්ලිව්. කුමාරසිංහ, ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්, (පරිපාලන)
එන්.ඩබ්ලිව්. ආරියරත්න, ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්, (විමර්ශන)

අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරයි.

2017.08.10 දිනැතිව ස්වදේශ කටයුතු ලේකම් වෙනුවට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විමර්ශන) එන්. වසන්ත ආරියරත්න මහතා විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී/ අතිරේක ලේකම් (සංවර්ධන) වෙත පහත පරිදි දන්වා ඇත.

1. පරීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර නැත.
2. පැමිණිල්ල 2017.06.28 දින වන විට ලේඛනගත කර 2017.07.17 දින අතිරේක ලේකම් (පාලන හා විමර්ශන) වෙත යොමුකර ඇත.
3. නැත.
4. මෙම පැමිණිල්ලට අදාළව තාක්ෂණ නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග ලබා දී නැත.
5. නැත.

එසේම පොදු අධිකාරිය විසින් 2019.04.10 දිනැතිව සවිස්තර කරුණු දැක්වීමක් කොමිෂන් සභාවට යොමුකර ඇත. නමුත් 2019.04.10 දිනැති සවිස්තර කරුණු දැක්වීම හා 2017.08.29 දිනැති ලිපියේ පිටපත් අභියාචක වෙත පොදු අධිකාරිය විසින් සන්නිවේදනය කර නැති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

මෙහිදී 2019.04.10 දිනැති සවිස්තර කරුණු දැක්වීමේ ලිපිය හා 2017.08.29 දිනැති ලිපිය ඒවායෙහි මුල්පිටපත් හා සසඳා සත්‍ය පිටපත් ලෙස සහතික කර අභියාචක වෙත කොමිෂන් සභාව ඉදිරියේ ලබා දෙන ලදි.

කෙසේ නමුත් අභියාචක විසින් කරුණු දක්වන්නේ අභියාචකට ලබාදුන් තොරතුරු පිළිගත නොහැකි සත්‍යතාවයක් නොමැති තොරතුරු බවයි. එසේම පනත යටතේ නියමිත කාල සීමාවන්ට අනුකූලව ක්‍රියා නොකිරීම මත අදාළ නිලධාරීන්ට එරෙහිව තමන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන බවද අභියාචක සඳහන් කර සිටින ලදි.

මෙහිදී කොමිෂන් සභාව විසින් අභියාචක වෙත අවධාරණය කර සිටියේ පොදු අධිකාරිය විසින් ලබාදුන් තොරතුරු තමන් හට පිළිගත නොහැකි වන්නේ නම් කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව අභියාචක හට පනතේ 34(1) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත හැකි බවයි.

මෙහිදී කොමිෂන් සභාව අවධාරණය කර සිටියේ පනතේ 39(4) වගන්තිය ප්‍රකාරව පනත යටතේ අපරාධ නඩු පැවරීමක් කොමිෂන් සභාව විසින් ආරම්භ කළ යුතු වන්නේ 39(1)(අ) සිට (උ) දක්වා වන අවස්ථා යටතේ වන අතර මෙහිදී නම්කළ නිලධාරියා ප්‍රතිචාර නොදැක්වීමක් චේතනාන්විතව

වැරදි සහගතව, අසම්පූර්ණව හෝ නිවැරදි නොවන තොරතුරු සැපයීමක් සිදුකර නොමැති බැවින් **39(4)** යටතේ අපරාධ නඩුවක් ආරම්භ කළ නොහැකි බවයි.

එසේම අදාළ නිලධාරීන් නිසි කාල සීමාව අනුව කටයුතු කිරීමට අපොහොසත්වීම සම්බන්ධව කොමිෂන් සභාවට ගතහැකි ක්‍රියාමාර්ගය වන්නේ පනතේ 38 වගන්තියේ සඳහන් පරිදි විශේෂයෙන්ම මෙම අභියාචනයට අදාළව පනතේ 38(1)(ආ)(ii) වගන්තිය යටතේ කටයුතු කිරීම බවයි.

පනතේ **38(1)(ආ)(ii)** වගන්තිය පහත පරිදි වේ;

> *යම් නම් කළ නිලධරයකු විසින් සිතාමතාම -... 31 (3) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, සිදුකරන ලද අභියාචනයක් පිළිබඳ තීරණයක් ලබා දීමට කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරීම සිදුකරනු ලබන අවස්ථාවක දී, ... කොමිෂන් සභාව විසින් එම කරුණ පිළිබඳව නිසි විනය බලධරයාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.*

නියෝගය:

ක්‍රියාවලියේ දීර්ඝ ප්‍රමාදයකින් පසුව වුවද අභියාචක විසින් අයදුම්කරන ලද අදාළ තොරතුරු පොදු අධිකාරිය විසින් අභියාචනා විභාගයේදී කොමිෂන් සභාව ඉදිරියේ ලබාදෙන ලදි.

ඒ අනුව නම්කළ නිලධාරියා විසින් අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට සැලකිය යුතු ලෙස ප්‍රමාදවී ඇති බව සොයාගැනීමෙන්, පනතේ **31(2)** හා **(3)** වගන්තීන් උල්ලංඝණය වී ඇති බවත් ඒ අනුව, එකී උල්ලංඝණය කිරීම පොදු අධිකාරියේ/විනය අධිකාරියේ අවධානයට යොමුකරන අතර උක්ත කී උල්ලංඝණය සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම තොරතුරු ඉල්ලීම් හා අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී පනත මඟින් නියම කර ඇති කාල පරාසයන් තුළ කටයුතු කිරීම පැහැර හැරීම වැලැක්වීම සඳහා සහතික වීමට ගනු ලැබූ පියවර පනතේ **38(2)** වගන්තිය මඟින් දක්වා ඇති ආකාරයට මාසයක කාලයක් ඇතුළත කොමිෂන් සභාවට දැන්විය යුතුය.

කෙසේවෙතත්, කොමිසම ඉදිරියේ ඇති කරුණු මත, පනතේ **39(1)(අ)** වගන්තිය උල්ලංඝණය වන ආකාරයට තොරතුරු සැපයීම සිතාමතා අවහිර කරනු ලබන හෝ චේතනාන්විතව වැරදි සහගත, අසම්පූර්ණ හෝ නිවැරදි නොවන තොරතුරු සැපයීමක් පොදු අධිකාරිය විසින් සිදුකර නොමැති බවටද තීරණය කර සිටී.

ඒ අනුව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක **27** (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක **2004/66, 2017.02.03**) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

..........................................................

මහින්ද ගම්මම්පිල - සභාපති

..........................................................

කිෂාලි පින්ටෝ-ජයවර්ධන - කොමිෂන් සභා සාමාජිකා

..........................................................

එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

**...............................................................**
**රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජිකා**